# මූල්‍ය ප්‍රකාශනවල අංග

## The elements of Financial Statements

# මූල්‍ය ප්‍රකාශනවල මූලික අංගයන්

මූල්‍ය ප්‍රකාශනවල මූලික අංගයන් පහත පරිදි හඳුනාගෙන ඇත:

- වත්කම් (Assets)
- වගකීම් (Liabilities)
- හිමිකම් (Equity)
- ආදායම (Income)
- වියදම් (Expenses)



# මූල්‍ය ප්‍රකාශනවල අංග පැහැදිලි කිරීම

**වත්කම්:** අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය විසින් පාලනය කරනු ලබන ආර්ථික සම්පත්.

**වගකීම්:** අතීත සිදුවීම්වලින් පැන නගින ආයතනයේ වර්තමාන බැඳීම්.

**හිමිකම්:** වත්කම්වලින් සියලුම වගකීම් අඩු කළ පසු ඉතිරි වන අයිතිය.

**ආදායම:** වත්කම්වල වැඩි කිරීමේ හෝ වගකීම්වල අඩු කිරීමේ ස්වභාවයෙන් යුක්ත අයිතිකරුවන්ගේ දායකත්වයෙන් තොරව හිමිකම ඉහළ නැංවීමයි.

**වියදම්:** වත්කම්වල අඩු කිරීමේ හෝ වගකීම්වල වැඩි කිරීමේ ස්වභාවයෙන් යුක්ත අයිතිකරුවන්ගේ දායකත්වයෙන් තොරව හිමිකම්වල සිදුවන අඩුවීම්.

# මූල්‍ය ප්‍රකාශනවල සංරචක

| අංකය | ප්‍රධාන සංරචක (Components) |
| --- | --- |
| 1 | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (Statement of Financial Position) |
| 2 | සමස්ත ආදායම් ප්‍රකාශනය (Statement of Comprehensive Income) |
| 3 | හිමිකම්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය (Statement of Changes in Equity) |
| 4 | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (Statement of Cash Flows) |
| 5 | ගිණුම් වලට සටහන් සහ ප්‍රමාණාත්මක ගිණුම් කරන ප්‍රතිපත්තීන් සහ අනෙකුත් සවිස්තරාත්මක සටහන්වල සාරාංශයක් සමඟින් වන උපලේඛණයන් |

# මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මැනීමේ විවිධ පදනම්

මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ මූලිකාංගයන් වන පත්කම් වගකීම් හිමිකම් ආදායම් වියදම් මූල්‍ය ප්‍රකාශනයන්වල් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආදායම් ප්‍රකාශනයේ නිරූපණය කරන්නේ කෙසේද යන්න මේ යටතේ සලකා බැලේ මේ සඳහා නිශ්චිත මිනුම් පදනම් අතරක් දැකිය හැකියි.

ඓතිහාසික පිරිවැය

ප්‍රවර්ථන පිරිවැය

උපලබ්ධි වටිනාකම

වර්තමාන වටිනාකම

# ගැලපුම් ඇතුළත් කිරීම් (Adjustment Entries)

- **වැදගත් කාර්යභාරය:** මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
- **නිවැරදිභාවය:** ගිණුම් කාලච්ඡේදය අවසානයේ සිදු කරන සංශෝධන.
- **වාර්තාකරණය:** මූල්‍ය තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කරයි.

# ගැලපුම් සටහන් පහත පරිදි වේ

- අවසන් තොගය පිළිබඳ ගැළපීම
- උපචිතයන් පිළිබඳ ගැලපීම
- ඉදිරියට කළ ගෙවීම් / ඉදිරියට ලද ලැබීම් ගැලපීම
- බොල් ණය පිළිබඳ ගැලපීම
- කපා  හල බොල්ණය නැවත ලැබීම පිළිබඳ ගැලපීම
- අඩ මාන ණය/ හානි කරන අලාභ පිළිබඳ ගැලපීම
- ජංගම නොවන වත්කම් ඉවත් කිරීම් ක්ෂය පිළිබඳ ගැලපීම
- සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් පිළිබඳ ගැළපීම
- අයිතිකරුවන්ගේ ගැනිලි පිළිබඳ ගැලපීම
- තොග හානි සහ රක්ෂණ වන්දි පිළිබඳ ගැලපීම
- VAT ගැලපීම



# අවසන් තොගය පිළිබඳ ගැළපීම

01.අවසාන තොගයේ පිරිවැය පමණක් දී ඇති විටෙක,

අවසාන තොග ගිණුම හර

වෙළඳ ගිණුම බැර

02.අවසාන තොගයේ පිරිවැය සහ තොගයේ ශුද්ධ උපලබ්දි අගය දී ඇති විටෙක,

- ශුද්ධ උපලබ්ධි අගය යන්නෙන් අදහස් කරන්නේ අවසන් තොගය අනාගතයේදී විකුණා ලැබෙන මුදලින් එම තොගේ තවදුරටත් සකස් කිරීමට සහ විකිණීම සඳහා දැරීමට සිදුවන අපේක්ෂිත වියදම් අඩු කළ පසු ලැබෙන අගයයි.



**Notes :**

# Thank you